# ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය



සමෘද්ධිමත් කෘෂි ආර්ථිකයක් බිහිකරලීමේ නිරන්තර උත්සාහයක නිරත වන කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ සඳහා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ආරම්භ කළේය. එහිදී තුන් අවුරුදු ආහාර නිෂ්පාදන සැලසුම් අනුව රටේ ආහාර නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයක්ම, දිස්ත්‍රික්කයක්ම සහ පළාතක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වය ලබාදීමට හැකිවීම වත්මන් කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මා ලද අනගි අවස්ථාවකි. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සහ සාර්ථකව ක්‍රියාත්මක වෙතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතින අතර ඒ සඳහා හදවතින්ම සුබ පැතුම් එක්කරමි.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යනු එක් පාර්ශවයකට පමණක් සිදු කළ හැකි දෙයක් නොවේ. සියලුම පළාත් මෙම වැඩසටහන සඳහා උපරිම දායකත්වය සැපයිය යුතුය. සෑම පාර්ශවයක් විසින්ම කළ යුතු කාර්යයන් නිසියාකාරව ඉටු කිරීම තුළ පමණක් මෙහි සාර්ථකත්වය රැඳී පවතියි.

මෙම තුන් අවුරුදු සැලැස්ම අනුව වඩාත් ක්‍රමානුකූලව වගා කටයුතු සිදු කළ යුතුය. ඒ ඒ පළාත්වල පවතින පාරිසරික සාධක මත පිහිටා පසට ගැලපෙන බෝගය හඳුනාගෙන වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම වැදගත්ය. මෙම සාමුහික ක්‍රියාවලියේ දී ජාතික ඉලක්ක ජය ගැනීමට නම් පළාත් අතර නිවැරදි සන්නිවේදනයක් තුළින් අන්‍යයෝන්‍ය අවබෝධය වර්ධනය කර ගත යුතුය.

රටේ ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර රට තුළම නිෂ්පාදනය කරමින්, කෘෂි ආර්ථිකය සවිබල ගන්වන ගොවි ප්‍රජාවගේ අතමිට සරු කරමින් කෘෂිකර්ම අංශය දියුණු කිරීමට ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ඉවහල් වනු ඇත. ඒ සඳහා දිවයිනේ සෑම පළාතක්ම ස්වකීය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි. සීමා මායිම් පසෙකලා එකම අරමුණක් වෙනුවෙන් අප සැම එක්වන්නේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපේක්ෂාව සඵල වනු නිසැකය.

දුමින්ද දිසානායක (පා.ම)
කෘෂිකර්ම අමාත්‍ය

# කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දූපත් රාජ්‍යයක් වන අප විශිෂ්ඨ ගණයේලා සම්පත්වලට හිමිකම් කියන අතර ඉන් එක් සම්පතක් ලෙස කෘෂිකර්මාන්තය හැඳින්විය හැක. ග්‍රාමීය ජනතාවගෙන් 65% ක් පමණ කෘෂි ආර්ථිකයකට අයිතිවාසිකම් කියන අතර ඔවුන්ගේ දිවි පැවැත්ම කෘෂිකර්මාන්තය සමඟ බැඳී පවතී. තවද කාර්මික විප්ලවයත් සමඟ ලෝකයේ බොහෝ රටවල් නොයෙකුත් යාන්ත්‍රික කර්මාන්තවලට යොමු වීමත් සමඟ කෘෂිකර්මාන්තයට වූ අවධානය අඩු විණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් විවිධ කතිකා ගෝලීය වශයෙන් ඇති කිරීමටත් විවිධ සම්මුතීන් ගෝලීය වශයෙන් ගෙන ඒමටත් සිදු විණි. අප ඉදිරියේ එලෙස පවතින ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවධානම අවම මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක ඇමතිතුමාගේත්, ජනාධිපති කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ජාතික ආහාර නිෂ්පාදන තුන් අවුරුදු සැලැස්ම එළි දක්වන ලදී. මෙහි මුඛ්‍ය පරමාර්ථය වූයේ අප මිහිතලය තුල ස්වයංපෝෂිත ලෙස නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග වගා කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, යටිතල පහසුකම්, බීජ, පොහොර වැනි අංග ලබා දෙමින් ගොවි ජනතාව සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන එක් කර ගනිමින් 2018 වන විට මිරිස්, බී ලූනු, අල, මුං ඇට වැනි තෝරා ගත් මූලික බෝග ලැයිස්තුවකින් රට ස්වයංපෝෂිත කරවීමය. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය සමස්ථ ගොවි ජනතාවටත් සියලුම නිලධාරීන්ටත් ලැබේවායි පතමි.

වසන්ත අළුවිහාරේ (පා.ම)
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

# උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පණිවිඩය



2015 ජනවාරි 08 වැනි දා සිදුවූ විප්ලවීය ජයග්‍රහනයෙන් අනතුරුව ශ්‍රී ලංකා රාජ්‍ය නායකයා වශයෙන් පත් වූ ගරු මෛත්‍රීපාල සිරිසේන පනාධිපතිදුන් ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය සදහා ඉලක්ක ගත වැඩ පිළිවෙලක් හදුන්වා දෙන ලදි. ඒ ඔස්සේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ නව බෝග වර්ග හදුන්වා දීමේ වැඩසටහන් රාශියක් දියත් කර ඇත. උතුරු මැද පළාත් සභාව වෙතින් ජාතික ආහාර නිෂ්පාදන කාර්යය සදහා පළාත් කෘෂි කර්ම අමාත්‍යාංශය ද සුවිශේෂ දායකත්වයක් සපයයි. වැඩි ඵලදාව සහිත කෘෂි කාර්මික බෝග නිශ්පාදනය සදහා විශේෂ වැඩ පිළිවෙලක් දියත් කර ඇති අතර ප්‍රධාන ආහාරය වන වී වගාවේදී නවතම බිත්තර වී වර්ග හදුන්වා දී ඇති අතර අතිරේක බෝග වගාවේදි උතුරු මැද පළාතට යෝග්‍ය පලතුරු වර්ග හදුනාගෙන ඒවායේ පැල ගොවීන් අතර බෙදා දීමට ද කටයුතු කර ඇත.

විශේෂයෙන්ම අඹ, දොඩම්, අන්නාසි වැනි පලතුරු වර්ග සදහා පැල වර්ග මෙන්ම වැඩි ඵලදාව සහිත කුරක්කන්, බඩ ඉරිගු, උඳු, මුං, කව්පි වැනි හෝග වගාවන් සඳහා බීජ වර්ග ගොවීන් අතර බෙදා දීමට ද පළාත් සභාව විසින් කටයුතු කර ඇත. ගොවීන් අතර බෙදා දෙන පැල වර්ග හා බීජ වර්ග වගා කිරීමේ සිට ඵල නෙලීම දක්වා වූ අධීක්ෂණ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කෙරේ. ගොවීන් වෙත බෙදා දෙන පැල හෝ බීජ වර්ග පිළිබඳ නිසි පසුවිපරමක් මෙතෙක් සිදු නොවීම නිසා වගා ඉලක්කයන් සාර්ථක වී නොමැති පසුබිමක් තුල උතුරු මැද පළාත් සභාව මේ නව පසුවිපරම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙවැනි ඉලක්ක ගත වැඩ පිළිවෙල ඔස්සේ ප්‍රාදේශීය මෙන්ම පළාත් හා ජාතික මට්ටමින් දියත් කරන මෙබඳු වැඩ සටහන් ආරම්භයේ සිට අවසානය දක්වාම අදාල නිලධාරීන් යොදවා පසුවිපරම් කරන්නේ නම් ආහාර නිශ්පාදන ඉලක්ක ජයගත හැකි බව මාගේ විශ්වාසයයි. ජාතික මට්ටමින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදි ප්‍රාදේශීය හා පළාත් මට්ටමින් ලබාගන්නා දායකත්වය ජාතික මට්ටමේ අරමුණු කරා ළගා වීමට මහත් රුකුලක් වනු ඇත.

එහිදි උතුරු මැද පළාත් සභාව වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම පළිබඳව කෘෂිකර්ම අමාත්යප දුමින්ද දිසානායක මැතිතුමා ප්‍රමුඛ එම අමාත්‍යාංශයට උතරු මැද පළාත් සභාව වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරන අතරම ජාතික ආහාර නිශ්පාදන වැඩ සටහන වෙනුවෙන් කෙරෙන ඉලක්ක ගත හෝග නිශ්පාදන වැඩ සටහන අතිශයින් සාර්ථකව එය ස්වං පෝෂිත ශ්‍රී ලංකාවක් බිහි වීමට ඉවහල් වේවායි ප්‍රාර්ථනා කරමි.

ජේෂල ජයරත්න බණ්ඩාර, ප්‍රධාන අමාත්‍ය, (උතුරු මැද පළාත)

# උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය



මාගේ ධූර කාලය තුල ආහාර නිෂ්පාදන ජාතික වැඩ සටහන සඳහා සක්‍රීය වශයෙන් දායක වීමට මාගේ අමාත්‍යාංශයට අවස්ථාව හිමිවීම පිළිබඳව මම අතිශයින්ම සතුටට පත්වෙමි. ශ්‍රී ලංකාවේ ජාතික ආහාර අවශ්‍යතාවයෙන් ඉතා විශාල පංගුවක් නිෂ්පාදනය කරනු ලබන්නේ මාගේ අමාත්‍යාංශය බල ප්‍රදේශය වන අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි වීම මා හට ඉමහත් ගෞරවයක් බව මෙහිලා සිහිපත් කල යුතුය. වී සහ ප්‍රධාන අතිරේක ආහාර බෝගයන් වන බඩඉරිඟු, උඳු, සෝයා හා කුරක්කන් අවශ්‍යතාවයෙන් ඉහල ප්‍රතිශතයක් සහ අනෙකුත් වියලි කලාපීය එළවළු හා පලතුරු අවශ්‍යතාවයෙන් අතිවිශාල ප්‍රමාණයකුත් මෙම පළාතෙන් නිෂ්පාදනය කරනු ලබයි. එසේම මාගේ අමාත්‍යාංශයට අයත් පශු සම්පත් විෂයය යටතේ ජාතික දියර කිරි නිෂ්පාදනයෙන් අතිවිශාල ප්‍රමාණයක් අප පළාත තුල නිෂ්පාදනය කරනු ලබන අතර, මිරිදිය ධීවර අංශයේ නිෂ්පාදනයන්හිද අප සිටින්නේ ඉහල ස්ථානයක් අත්පත් කර ගනිමිනි. ඒ අනුව ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන සඳහා මාගේ අමාත්‍යාංශය ඉතා ඉහල දායකත්වයක් සපයනු ලබන බව මෙහිදි ඉමහත් සතුටකින් යුක්තව අවධාරණය කරනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන එහෙත් දේශීය වශයෙන් නිෂ්පාදනය කල හැකි ආහාර වර්ග අප රට තුලම නිෂ්පාදනය කිරිම සඳහා මධ්‍යම රජය මෙන්ම පළාත් මට්ටමේ ව්‍යාප්ති කටයුතු සිදු කරනු ලබන පළාත් අමාත්‍යාංශ එක්ව කටයුතු කිරීම සඳහා වැඩපිලිවෙලක් සකස් කර තිබීම බෙහෙවින්ම පැසසිය යුතු කාරණාවකි. එම තත්වය නෛතික වශයෙන් තහවුරු කරනු ලැබූ "වාද්දූව ප්‍රකකාශනය" 2016 - 2018 කාල සීමාවෙන් ඔබ්බට ගොස් තිරසාරව ශ්‍රී ලාංකීය භූමිය තුල ක්‍රියාත්මක කිරීම මගින් කෘෂිකර්ම ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක වනු ලබන විවිධ රාජ්‍ය ආයතන වල සීමා මායිම් ස්වීකරණය වී එහි ප්‍රතිඵල මෙම භූමිය තුල කෘෂිකාර්මික හා ආහාර නිෂ්පාදන අංශයන්හි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ශ්‍රමය වගුරුවන ගොවි ජනතාව වෙත ලබා දීමට හැකියාව ලැබීම අප විසින් අත්පත් කර ගත් ජයග්‍රහණයක් බවද මෙහිලා සිහිපත් කරනු කැමැත්තෙමි.

ඒ අනුව ජාතික ආහාර නිෂ්පාදනයෙන් ස්වයං පෝෂිත වූ ඉසුරුබර "ගොවි බිමක් හා ඉසුරුමත් ගොවි ප්‍රජාවක්" නිර්මාණය කරලමින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන අතිසාර්ථක වේවා යයි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ආර්.එම්.පී.බී.රත්නායක
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අළෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර හා නිවාස කටයුතු අමාත්‍ය, උතුරු මැද පළාත.

FOOD FIRST

**අහසින් වැටෙන එක් දිය බිඳුවක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට එක් වීමට ඉඩ නොදිය යුතුය.**

**– මහා පරාක්‍රමබාහු රජතුමා**

# පටුන


01. හැඳින්වීම ---------------------------------------------------------------------------------- 1-2

02. පළාත් සිතියම ---------------------------------------------------------------------------- 3

03. පළාත් ඉලක්ක සාරාංශය ------------------------------------------------------------------ 4-5

04. අනුරාධපුර දිස්ත්‍රික්ක ඉලක්කය --------------------------------------------------------------- 6-89

05. පොළොන්නරුව දිස්ත්‍රික්ක ඉලක්කය---------------------------------------------------------- 90-135